# ජන අවියක් වන ජන සවිය

ජනසවිය බිහි කරන්නට පදනම් වූ චින්තනය බිහිවූයේ ජනතා අරගලය පිළිබඳව සූක්ෂම ආකාරයෙන් අධ්‍යයනය කිරීමෙන් හා විමසීමෙනි. ජනසවිය වැඩ සටහනේ නිර්මාණකයන් හා ආදි කර්තෘවරුන් වන්නේ දිළිඳු ජනතාවමය. මෙම ජනතා චින්තනය ඒකරාශි කරණ දිළිඳු ජනතාවගේ යහපත උදෙසා වැඩ සටහනක් බිහිකිරීමේ මෙවලම වූයේ ශ්‍රීමත් ජනාධිපතිතුමා ය. ජනතා උද්‍යෝගය, අරගලය, කුශලතා පරාජයන් හා ජයග්‍රහණයන් මෙම වැඩ සටහන ආරම්භ කිරීමෙහි ලා අමු ද්‍රව්‍යය විය. තව දුරටත් පැහැදිලි කළහොත් එය දිළිඳු භාවය තුරන් කිරීමේ කාර්යෙහිදී විශේෂඥයන් වන දිළිඳු ජනතාවගේ අරගලය හා වේදනාවන් අධ්‍යයනය කිරීමෙන් බිහිවූවක් බව සඳහන් කළ යුතුය. ජනසවිය වැඩ සටහනේ, සරල, පැහැදිලි හා අභීත අරමුණ වන්නේ දිළිඳු භාවය ජය ගැනීමයි. පුළුල් වශයෙන් ඒ සඳහා සුදුසු තත්ත්වයන් බිහි කරන මෙම වැඩ සටහන, ජනතාවගේ දිළිඳු බව නැති කර ගැනීම සඳහා විශේෂ මෙවලම් කට්ටලයක් ද සපයයි. මෙය ආහාර මුද්දර ක්‍රමය මෙන් දිළිඳු ජනතාවට දෙන සහනාධාරයක් නොවේ. එම ජනතාවට දිළිඳු බව අභිබවා යෑමට දෙන ආධාරකයකි. මෙම තත්ත්වය විස්තර කිරීම සඳහා සුප්‍රකට චින්තක යෙකු වූ කොන්පියුසස්ගේ කථාවක් ගෙන හැර දැක්වීම කාලෝචිත යයි හඟිමි. අහර ඉල්ලා කුසගින්නෙන් පෙළෙන්නෙකුට මත්ස්‍යයෙකු දීමට පුද්ගලයෙකු උත්සාහ කළවිට, එම තැනැත්තාට මාළුවෙකු නොව බිලී පිත්තක් දෙන්නැයි කොන්පියුසියස් ඉල්ලා සිටියේ ය. යම් කෙනකුගේ ප්‍රශ්නයක් සඳහා තාවකාලික පිළියමක් යෙදීමට වඩා, ඔහුට එම ප්‍රශ්නයෙන් ගැලවීමට ආධාර කිරීම මැනවැයි කොන්පියුසස්ගේ දැක්ම විය. එලෙසින් බලන කළ ආහාර මුද්දර ක්‍රමය මත්ස්‍යයෙකු වන අතර ජනසවිය බිලිපිත්ත වෙයි.

මෙම වැඩ සටහනේ ප්‍රතිපත්තිය සිව් වදැරුම් වෙයි. එහි වඩාත් වැදගත් වන අංශය වන්නේ දිළිඳු පවුලයි. මුළු ඉත්මාව ම ගෙතී ඇත්තේ මෙම දිළිඳු පවුල් වටාය. දිළිඳු බවින් මිදෙන්නට ඔවුන් තුළ ඇති අවශ්‍යතාවයට හා ඒ සඳහා ඔවුන්ගේ දැනුමට ප්‍රමුඛත්වය හිමිවිය යුතුය. දෙවැනි කරුණ මෙම වැඩ සටහනේ කාල නියමයයි. මාස 24 කට සීමාවී ඇති මෙය කිසිදු විටෙක වෙනස් වන්නේ හෝ කාලය දික් කිරීමක් වන්නේ හෝ නොවේ.

තුන් වැන්න සම්පත් කට්ටලයයි. දැනට රුපියල් 700 කට අඩු මාසික ආදායමක් ලබන පවුල් වලට මෙමගින් මසකට රුපියල් 2500 ක ආධාරයක් හිමිවේ. ඉන් රුපියල් 1042 ක් පවුලේ දෙමහල්ලන්ගේ නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අනිවාර්ය ඉතිරි කිරීමේ ගිණුමක මාසිකව තැන්පත් කෙරේ. ඉතිරි රුපියල් 1458 ට වටිනා කූපන් පත් ඇති ජනසවි පතක් එම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ
සාමාන්‍යාධිකාරී

**සුසිල් සිරිවර්දන විසිනි**

පවුලට ලබා දෙනු ලැබේ. ආහාර මුද්දර කාඩ් පතක් වැනි මෙම ජනසවි පතෙන්, එම පවුලට අදාළ සමූපකාර ප්‍රදේශිකයෙන් රුපියල් දාහ (1000) ක් වටිනා වෙළඳ ද්‍රව්‍ය රාශියක් ලබා ගත හැක. එලෙස ගත හැකි ද්‍රව්‍ය වලට, ආහාර, ඇඳුම් පැළඳුම් පාසැල් වලට අවශ්‍ය ද්‍රව්‍ය, කෘෂිකර්ම යෙදවුම් හා මෙවලම් සහ භූමිතෙල් ආදිය ඇතුළත් වේ. මෙලෙස ලබා ගත හැකි ආහාර වලට සහල්, පිටි, සීනි, කිරි පිටි, කරවල හා කව්පි, තල වැනි රළු ධාන්‍ය වර්ග ඇතුලත් වේ. එයින් ඉතිරි රුපියල් 458 සඳහා වෙන ම කූපන් වර්ගයක් ඇති අතර, ඒවායේ තවත් ද්‍රව්‍ය මිලට ගැනීමට හෝ බැංකුවක තැන්පත් කිරීමට හැකිය. මෙම මුදල ඉතිරි කිරීමට පොළඹවනු පිණිස ජාතික ඉතිරි කිරීමේ බැංකුව හෝ ග්‍රාමීය බැංකු විශේෂ පොලී අනුපාතයක් නියම කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සිව්වැන්න ආධාරක සේවාය. මෙම අංශයට රාජ්‍ය, සංස්ථා හා රාජ්‍ය නොවන අංශ ගැනේ. මෙමගින් කෙරෙන්නේ මෙම වැඩ පිළිවෙලට අවශ්‍ය තත්ත්වයන් ඇති කිරීමට ආධාර ලබා දීම ය.

මෙහි ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙල වන්නේ කාර්ය බද්ධ ජනතා සහභාගිත්වයෙන් යුත් ජනතාව මැදිකරගත් සංවර්ධන ක්‍රියා දාමයකි. මෙය ජනප්‍රිය ව්‍යාපෘති ක්‍රමය නොවේ. දිවයින මුළුල්ලේ ගම් පියසි 30,000 ක් පුරා එකවිට ක්‍රියාත්මක වන ක්‍රියාවලියකි. එය කුඩා ගම් පියසක සිට මුළු රටම දක්වා විහිදී යයි. එහෙයින් එය සංස්කෘතිකමය වශයෙන් සුභදායක, ස්වශක්තිය වර්ධනය කරන ජාතික මට්ටමේ සමාජ ස්ථාවරත්වය ලබා ගත හැකි වැඩ පිළිවෙළකි. ජනතාව වටා ගෙතී ඇති මෙම ජනසවිය වැඩ සටහන ජනතාවගෙන් ආරම්භවී ඔවුන්ගෙ ග්‍රාම අවසන් වෙයි. මෙම සහන සැළසෙන ජනතාව තෝරා ගන්නේ එම ප්‍රජාව විසින් මය. එය ආහාර මුද්දර ක්‍රමය මෙන් ආවරනය කළ එකක් නොව, කාටත් දැන ගත හැකි විවෘත වැඩ පිළිවෙලකි. මෙම දිළිඳු ජනතාව තෝරා ගන්නා ක්‍රම දෙකක් වෙයි. ආහාර මුද්දර ලාභීන් වීම පළමු වැන්නයි. දෙවැන්න දෘශ්‍යමාන සාධක ක්‍රමයයි. එමගින් යම් පවුලක් ජීවත් වන නිවසකට ගිය විට ඔවුන්ට එම සහන සුදුසු නුසුදුසු බව තීරණය කර ගත හැකිය.

ජාතික ප්‍රතිපත්ති සම්පාදක අමාත්‍යවරයාද වන ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා පෞද්ගලිකව මෙම ප්‍රතිපත්ති මෙහෙයවයි. මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ලා සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්ගෙන් සැදි අන්තර් අමාත්‍යාංශ කමිටු හයක් ඒ ඒ අංශ වලට අයත් කාර්ය භාරයන් ඉටු කරයි. උදාහරණයක් වශයෙන් රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයා මානව සංවර්ධන කමිටුවේ සභාපති වරයා ය. මෙම වැඩ සටහනේ පුහුණු කිරීම් අංශ භාරවී ඇති මෙම කමිටුවට රාජ්‍ය නිලධාරීන් හැරුණු විට පීඩා, ඉරෙඩ් හා සණස වැනි රාජ්‍ය නොවන සංවිධාන වල නියෝජිතයන්ද ආරම්භයේ සිට ම සහභාගි වෙති.,

මෙම වැඩ සටහන ගම් මට්ටමේ ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කිරීමට එක් නිදසුනක් ගෙන හැර දැක්වීමට

**මෙය ආහාර මුද්දර ක්‍රමය මෙන් දිළිඳු ජනතාවට දෙන සහනාධාරයක් නොවේ. එම ජනතාවට දිළිඳුබව අභිබවා යෑමට දෙන ආධාරකයකි. මෙම තත්ත්වය විස්තර කිරීම සඳහා සුප්‍රකට චින්තකයකු වූ කොන්පියුසියස්ගේ කථාවක් ගෙන හැර දක්වීම කාලෝචිත යයි හඟිමි. ආහාර ඉල්ලා කුසගින්නෙන් පෙලෙන්නෙකුට මත්ස්‍යයෙකු දීමට පුද්ගලයෙකු උත්සාහ කළවිට, එම තැනැත්තාට මාළුවෙකු නොව බිලීපිත්තක් දෙන්නැයි කොන්පියුසියස් ඉල්ලා සිටියේය. යම් කෙනකුගේ ප්‍රශ්නයක් සඳහා තාවකාලික පිළියමක් යෙදීමට වඩා, ඔහුට එම ප්‍රශ්නයෙන් ගැලවීමට ආධාර කිරීම මැනවැයි කොන්පියුසියස්ගේ දැක්ම විය. එලෙසින් බලන කළ ආහාර මුද්දර ක්‍රමය මත්ස්‍යයෙකු වන අතර ජනසවිය බිලීපිත්ත වෙයි.**

කැමැත්තෙනි. කඹුරුපිටිය ආසනයේ තිහගොඩ උප දිසාපති කොට්ඨාශයේ ගම් 53 ක් ඇති අතර උප දිසාපති වරයා යටතේ ගම් මට්ටමේ සේවය කරන නිලධාරීන් 44 දෙනෙකු සිටිති. ඒ අනුව එක් නිලධාරියෙකු බොහෝ විට එක් ගමක කටයුතු වල නියැලෙයි. එම නිලධාරියා එම ගමෙහි බාහිර විපර්යකාරකයා වන අතර ගමේ ජනතාවගෙන් තේරනු—ඔවුන්ගේ විස්වාසය දිනා ගත් නියෝජිතයන් සිව් දෙනෙකු ඇතුළත් සහාය කණ්ඩායමක් තෝරා ගනු ඇත. එම කණ්ඩායමට අනිවාර්යයෙන් ම කාන්තාවක් ඇතුළත් විය, යුතුමය. මෙම කණ්ඩායම විසින් ආහාර මුද්දරලාභීන්ගේ විස්තර ලේඛණයක් පිළියෙළ කර ගම්මාන තුළ ප්‍රසිද්ධ කරනු ලැබේ. අනතුරුව ගමේ සියළු දෙන පොදු ස්ථානයක දී කැඳවා දිළිඳු පවුල් තෝරා ගෙන එම පවුල් වලට ජනසවි ආධාරක සුදුසු කම් ලැබූ බවට හිමිකම් ලිපියක් නිකුත් කරනු ලැබේ. මෙම සහායක කණ්ඩායමේ වැඩ පිළිවෙල ප්‍රාදේශීය මට්ටමේ දී නිරීක්ෂණය කිරීමට හා උපදෙස් දීමට තිහගොඩ උප දිසාපති කොට්ඨාශය කලාප 8 කට බෙදා ඇති අතර එම එක් එක් කලාපයක් ප්‍රදේශීය මටට්මේ නිලධාරියෙකුගේ මෙහෙය වීම යටතේ පවතී. මේ ආකාරයට ගම් මට්ටමේදීත් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා අවසන් වශයෙන් ජාතික මට්ටමේදීත් එක්, වරම මෙම වැඩ සටහන ක්‍රියාත්මකවෙයි.

අවසන් වශයෙන්, මෙම ක්‍රියාවලිය මගින් මෙරටේ පරිපාලන ව්‍යුහයට කෙරෙන බලපෑම සඳහන් කළ යුතු වෙයි. අන්ත දිළිඳු පවුල් වලට ආර්ථිකමය හා සමාජමය බලය ලබා දෙන මෙම වැඩ සටහන, කාලාන්තරයක් තිස්සේ මෙ රටේ පොදු ජන අපේක්ෂාවක් වූ පරිපාලන තන්ත්‍රයෙහි මහා ප්‍රතිසංවිධානයක වින්නඹු මාතාව බවට පත්වෙනු ඇත. මෙතෙක් වරප්‍රසාදලත් නගරය කේන්ද්‍රය කරගත් පරිපාලන රටාව ඈත ගම් නියම් ගම්වල වෙසෙන දිළිඳු ජනතාව වෙත යොමුකෙරෙන බලවේගය බවට මෙම වැඩ සටහන පත්වෙනු ඇත. එමගින් බලය පහළ සිට ඉහළට ගලාඑන නව සංවර්ධන පරිපාලන රටාවකට අත්තිවාරම වැටෙනු ඇත. මේ ක්‍රියා වලිය ද නිදසුනකින් පැහැදිලි කිරීම කාලෝචිත යැයි හැඟිමි. අපේ රටේ ඇති අමාත්‍යාංශ සියල්ල සිය සේවාවන් සැපයීම හා පුහුණු කිරීම් සිදු කරන්නේ සිය අභිමතය අනුවය. මෙම වැඩ සටහන මගින් ගම් මට්ටමේ අවශ්‍යතා හඳුනා ගන්නා හෙයින්, ඒ ඒ ප්‍රදේශයට අවශ්‍ය සේවා සැපයුම් ඉටු කරන්නට අමාත්‍යාංශ වලට සිදුවේ. එය තනිතනිව නොව අමාත්‍යාංශ රාශියක් එක්වී කළ යුතු හෙයින් එම මට්ටමේද ප්‍රතිසංවිධානයක් සිදුවේ.

මෙහිලා සැළකිය යුතු අනෙක් අංශය වන්නේ මෙතෙක් නොසලකා තිබූ සම්පත් දෙස නව ආකාරයකින් බැලීමයි. උදාහරණයක් ලෙස ඌව වෙල්ලස්ස පිළිබඳව සම්ප්‍රදායානුකූල සංවර්ධනවේදීන් බලන්නේ අන්ත, දිළිඳු බව සම්පත් පහසුකම් අඩුබව, කාලගුණික දුෂ්කරතා යන සියල්ලන් පිරිනිසරු ප්‍රදේශ ලෙසිනි. එහෙත් 1818 දී නිදහස් සටන් මෙහෙය වූ ජනතාවගේ උරුමකරුවන් වන එහි වෙසෙන වත්මන් ජනතාවගේ දක්ෂතාවයන් හා හැකියාවන් අගය කිරීමටත් එම සම්පත උපයෝගී කර ප්‍රදේශය සංවර්ධනය කරන්නටත් මෙම වැඩ සටහනින් ඉඩකඩ සැලසේ. මෙනිසා ජනසවිය, දේශීය ඌරුවට අනුරූපවූ වැඩසටහනක් ලෙසද සැළකිය යුතු වෙයි. □

**ජන සෙත සැළසීමට .....**

(6 වෙනි පිටුවෙන්)

සහ ගොම පොහොර ප්‍රයෝජනයට ගත හැක. මේවා එකතු කිරීම තරමක වෙහෙසක් දැරිය යුතු කාර්යයක් නමුත් අඛණ්ඩ වෙළඳ පොලක් ඇත්නම් එය ආර්ථිකමය නිෂ්පාදනයක් වනවාට නොඅනුමනය. විශේෂයෙන් ගෙවතු වගා කරන්නන්, හෝ මල් නිෂ්පාදනය කරන අයගෙන්, කොම්පෝස්ට් පොහොර සඳහා ඉල්ලුමක් ඇත. එමනිසා මෙය සුළු පරිමාන ව්‍යාපෘතියක් ලෙස සලකා කුඩා කාණ්ඩවලට අතුරු රැකියාවක් ලෙස කිරීමෙන් අතිරේක ආදායමක් ලබා ගැනීමට හැකි වනු ඇත.

වෙළඳපොල ගැන සලකන විට දේශීය වෙළඳ පොල පමණක් නොව, විදේශීය වෙළඳ පොල ගැන ද සැලකිය යුතුයි. විශේෂයෙන් විදේශීය වෙළඳ පොල සඳහා ලංකාවේ ඉතා ලෙහෙසියෙන් නිෂ්පාදනය කල හැකි කෘෂි නිෂ්පාදන කිහිපයක් ඇත. එහෙත් මෙහි දී අවධානය කළ යුතු කරුණක් නම් නිෂ්පාදනය ආරම්භ කිරීමට පෙර වෙළඳ පොලක් තිබේ ද යන්න හොඳින් සොයා බැලීමය. උදහරණයක් ලෙස පැපොල් කිරි වලින් ලබාගත හැකි ''පැපෙන්'' වලට හොඳ විදේශීය වෙළඳ පොලක් ඇත. එසේ ම ලබුවර්ග සහ දේශීය පළතුරු වලට විදේශීය රටවල හොඳ ඉල්ලුමක් ඇත.

එමනිසා රටේ ආර්ථිකය ගොඩ නැංවීමට හා රැකියා බිහි කිරීමට අප ලෙහෙසියෙන් ඉවතලන කෘෂිකාර්මික අතුරු නිෂ්පාදන ආර්ථික භාණ්ඩවලට හැරවීමට මෙයට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් වරන්නේ නම් එය රටට පලදයක වනු ඇත. □